# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබාදීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

තාක්ෂණික පත්‍රිකා අංක 20 - 2021 මාර්තු

## මඤ්ඤොක්කා විචිත්‍ර වයිරස් රෝග ව්‍යාප්තියේ වැඩිවීමක්...

ටැන්සානියාවේ පිහිටි කඳුකර වනාන්තර ප්‍රදේශයකින් 1894 වැනි ඈත කාලයකදී මඤ්ඤොක්කා ශාක ඇසුරෙන් මුල්වරට හඳුනාගත් රෝගයක් අප්‍රිකානු මඤ්ඤොක්කා විචිත්‍ර රෝගය (African Cassava Mosaic Disease) සේ හඳුන්වනු ලැබීය. ශාකවල වර්ධනය අඩාල වී, පත්‍ර ඇඹරී සහ පිළිවෙලක් නැති විචිත්‍ර මෝස්තරයක් පරිද්දෙන් පත්‍ර මත කහ පාටින් පුල්ලි මතුවීම මෙම රෝගී තත්වයයි. මෙහි රෝගකාරකයා වන්නේ වයිරසයකි. පසුකාලීනව ලෝකයේ සෙසු ප්‍රදේශ වලටද රෝගය පැතිර ගිය අතර, කොවිඩ් වයිරසය ගැන අප දැන් කතාකරන්නා සේ මෙහි සිදුවූ විකෘති නිසාවෙන් යම් ප්‍රදේශ ආශ්‍රිතව අලුත් වයිරස් ප්‍රභේදයන්ද බිහිවී තිබේ. ඉන්දීය මඤ්ඤොක්කා විචිත්‍ර වයිරසය සහ ශ්‍රී ලාංකික මඤ්ඤොක්කා විචිත්‍ර වයිරසය යනු එවන් ප්‍රභේද දෙකකි. දිවයිනේ පළාත් කීපයකින්ම පසුගියදා වාර්තා වූ තත්වය ශ්‍රී ලාංකික මඤ්ඤොක්කා විචිත්‍ර රෝගය බව කෘෂි විද්වතුන් විසින් සනාථ කරගෙන තිබේ.



**"රෝග ලක්ෂණ හැටියට කියන්න තියෙන්නේ වෙනත් බෝගවල විචිත්‍ර රෝගයේදී පෙන්වන ලක්ෂණමම තමයි. පත්‍ර කොඩවෙනවා, කහ පුල්ලි හටගන්නවා. පත්‍ර ක්ෂේත්‍රපලය අඩුවීම නිසා ප්‍රභාසංස්ලේෂණය අඩුවෙලා ශාකය දුර්වල වෙනවා. සාමාන්‍යයෙන් මෙවැනි රෝග පැතිරවීමට වාහකයෙක් ලෙස සුදුමැස්සා සහභාගී උනත් මඤ්ඤොක්කා වගාතුල නම් අපිට එවැනි විශාල සුදුමැසි ගහනයක් දකින්නට ලැබෙන්නේ නෑ. ඒ නිසා රෝගය පැතිරීම ප්‍රධාන වශයෙන්ම සිදුවන්නේ රෝගී දඬු කැබලි මගින් කියලා නිගමනය කරන්න පුළුවන්"**



එසේ පවසන්නේ ගන්නෝරුවේ උද්‍යාන බෝග පර්යේෂණායතනයේ ප්‍රධාන ශාක ව්‍යාධි විද්‍යාඥ ගීතානී වීරරත්නයි. ඇය සඳහන් කරන ආකාරයට සුදුමැස්සන් යනාදිය රෝගය පැතිරීම සම්බන්ධයෙන් යම් දායකත්වයක් දැරිය හැකි වුවත් වර්තමාන තත්වය අනුව වගාකරුවන් වඩාත් සැලකිලිමත් විය යුත්තේ නව වගා පිහිටුවීමේදී නිරෝගී රෝපණ ද්‍රව්‍ය භාවිතා කිරීමටයි. පසුගිය දිනවල ගෙවතු වගාව ඇතුළු බෝග නිෂ්පාදන වැඩසටහන් කෙරෙහි ලොකු ජනතා උනන්දුවක් ඇතිවී තිබුණු බව නොරහසකි. බීජ හා රෝපණ ද්‍රව්‍ය කෙරෙහි ඇති ඉල්ලුම අසාමාන්‍ය ලෙස ඉහල ගිය අතර, මඤ්ඤොක්කා දඬු වලටත් එම තත්වය ඇති බව තහවුරු වූයේ, මග දෙපස වුවද තබාගෙන, දඬුවල දිග මීටර් ගණනින් මනිමින් පවා අලෙවිය සිදුවූ නිසාය. මඤ්ඤොක්කා විචිත්‍ර රෝග ලක්ෂණ ප්‍රකාශ වන්නේ ප්‍රධාන වශයෙන් ශාක පත්‍ර වලිනි. අලෙවියට තබා ඇති දණ්ඩක් පරීක්ෂාකර එය රෝගී ශාකයක්ද නැතිද යන්න තීරණය කල නොහැකිය. ඉහත දැක්වූ අධික ඉල්ලුම පිරිමසන්නට තේරීමකින් තොරව වෙළඳපොළට පැමිණි රෝගී දඬු හරහා දිවයින පුරා විචිත්‍ර රෝගය ව්‍යාප්තවූවා යයි සිතීම සාධාරණ

වේ. ගොවිපල් උපකරණ හෝ ආයුධ මගින් මෙම වයිරසය පැතිරෙන්නේ නැති නිසා, හදිසි පිබිදීමකින් රෝගය පැතිරී ගොස් ඇත්තේ රෝගී දඬු හරහා බව සනාථ වේ.

රෝගය පාලනය කිරීමට සුදුසුම ක්‍රමවේදය වන්නේ ප්‍රතිරෝධී මඤ්ඤොක්කා ප්‍රභේද භාවිතා කිරීම වුවත් අප සතුව එවැනි දෑ ඇති බවට ප්‍රබල පර්යේෂණාත්මක සාක්ෂි නැත. එබැවින් කලයුතු ප්‍රාථමික ක්‍රියාකාරකම වන්නේ දැනට පවතින මඤ්ඤොක්කා වගා පරීක්ෂාකරමින් රෝගී ශාක හඳුනා ගැනීම සහ වගාවන්හි සනීපාරක්ෂාව දියුණු කිරීමයි. ඇතැම් ශාකවල සම්පූර්ණ ගසෙහිම රෝග ලක්ෂණ නැත. සමහර අතුවල පමණක් කොළ කොඩවීම දකින්නට තිබේ. තවත් විටෙක වයිරසය ශාකයට අසාදනය වී තිබුනත් පිටතින් දැකබලා ගතහැකි තරමට විචිත්‍රත්වයක් පත්‍ර මගින් ප්‍රකාශ වන්නේද නැත. මේ නිසා රෝග ලක්ෂණ ඇති ශාක වගාවලින් ඉවත්කර සනීපාරක්ෂක තත්වය දියුණුකර ගැනීම කඩිනමින් කලයුත්තක් වේ. රෝගී ශාකයන් ඉවත්කරනා තෙක් එම ගස්වල දඬු මත තීන්ත වැනි යමක් ආලේප කිරීමෙන්, රෝපණ ද්‍රව්‍ය වශයෙන් ඒවා භාවිතාවීම වැලක්විය හැකිය.

නිරෝගී දඬු කැබලි තොරාගන්නවාට අමතරව පරිනත දඬු කැබලි හරහා නව වගා පිහිටුවීමට සැලසුම් කිරීමත් වැදගත්ය. හොඳින් මේරූ දණ්ඩක සංචිත ආහාර වැඩිපුර තිබේ. ඒනිසා බිහිවෙන අංකුරයන් ආරම්භයේදීම ජවසම්පන්නය. වයිරස ආසාදනයක් සිදුවුවත් දරා ගැනීමේ හැකියාව මෙන්ම වයිරස මර්දන හැකියාවද වැඩිය. නිසිලෙස පරිනත නොවුණු ලපටි දඬු කැබලි සිටවූයේනම් එම වගාව පහසුවෙන් රෝගයට පාත්‍ර විය හැකිබව මේ අනුව පැහැදිලිවේ.

**"වගාව සිටුවන පරතරයත් යම් කාර්යභාරයක් ඉටුකරනවා. දැනට නිර්දේශිත පරතරය වන්නේ තනි වගාවක නම් සෙන්ටිමීටර 90 X 90. උවමනාවට වඩා පැල අතර පරතරය අඩුකරලා බෝගය ස්ථාපනය කෙරුවොත්, අඩුවෙන් සිටින සුදුමැස්සා උනත් සක්‍රිය වාහකයෙක් වෙන්න ඉඩතියෙනවා. ක්ෂේත්‍රයේ තිබෙන වල් මඤ්ඤොක්කා, වල් රබර්, කුප්පමේනියා, වතුපාලු සහ වල්කරාබු වැනි ශාක වර්ග වයිරසයට රැකවරණය දෙන ශාක වශයෙන්ද සොයාගෙන තිබෙන නිසා සමස්තයක් වශයෙන් මඤ්ඤොක්කා වගාව තුල හොඳින් වල් මර්දනය කිරීමත් ආරක්ෂක උපක්‍රමයක් බව කියන්න පුළුවන්."** ගීතානි මහත්මිය තවදුරටත් පවසා සිටී.

මඤ්ඤොක්කා සමග අතුරුබෝග වගාකිරීමද අමතක කලයුතු නැත. වගාවේ පළමු මාස තුන තුළ මුං, කවුපි වැනි රනිල බෝගයක් හෝ බඩඉරිඟු වැනි කෙටි කාලීන බෝගයක් හෝ මඤ්ඤොක්කා පේළි අතර වැවිය හැකිවේ. මන්දයත් මඤ්ඤොක්කා බෝගය වේගයෙන් වැඩෙන්නට පටන් ගන්නේ මාස තුනක් පසුවූ විට නිසාය. රනිලයක් වවන්නේ නම් පසට පොහොර එකතුවීමක්ද සිදුවෙන නිසා තවත් වාසිදායකය. මඤ්ඤොක්කා හි පරතරය ගස් අතර අඩි තුනක් පමණ නිසා මෙම අමතර වගාවට, ඇති පමණ ඉඩ අවකාශයද ඇත. තනි වගාවක් ලෙස මඤ්ඤොක්කා පවතින විට මෙන් නොව මිශ්‍ර වගාවක් යටතේ එය පවතින්නේ නම් රෝග ව්‍යාප්තියට එය බාධාවකි. තමාගේ රෝපණ ද්‍රව්‍ය තමා විසින්ම නිපදවා ගතහැකි තත්වයක් ඇතිකර ගැනීමත්, රෝගී ගස් ඉවත්කර තම වගාව හුදකලා නිරෝගී වගාවක් ලෙස පවත්වා ගන්නට පියවර ගැනීමත්, වඩා සාධාරණ පරිසර හිතකාමී වයිරස පිටුදැකීමේ ක්‍රමවේදයන් වේ. රෝගය පවත්නා ඉඩම්වලට යාබදව නව වගා ඇරඹීමද සුදුසු නොවේ. වයිරසය රැගෙන යාමට යම් හැකියාවක් ඇති සුදුමැස්සා වැන්නවුන් හඹායමින් පළිබෝධනාශක යෙදීම නම් එතරම් ඵලදායක නොවනු ඇත.



**පිටපත : සනත් එම්. බණ්ඩාර - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව**

**තාක්ෂණික කරුණු : ගීතානි වීරරත්න, ප්‍රධාන ශාක ව්‍යාධි විද්‍යාඥ, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව**

පරිගණක නිර්මාණය : ගෝතමී ලියනගේ

අධීක්ෂණය හා උපදෙස් : ඩබ් .එල් හිරාන් පීරිස් (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)